10 ශ්‍රේණිය 13 පාඩම බුද්ධ ධර්මය

# ඇති තතු කියන තිලකුණු දහම



අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික අධ්‍යාපන ආයතනය

# ඇති තතු කියන තිලකුණු දහම



## ත්‍රිලක්‍ෂණය නම්

1. අනිත්‍ය
2. දුක්ඛ
3. අනාත්ම

# ඇති තතු කියන තිලකුණු දහම



අනිත්‍ය යනු
වෙනස් වීමයි/කැඩෙන බිදෙන සුලු බවයි

දුක්ඛ යනු
සියල්ල අනිත්‍ය නිසා දුක් සහිතය


අනාත්ම යනු
සියල්ල අනිත්‍යය එනිසා දුක් සහිතය යමක් අනිත්‍ය නම් දුක නම් මගේ යැයි ගත හැකි කිසිවක් නැත එනිසා අනාත්මය

ප්‍රඥාව ලෙස හැඳින්වෙන්නේ මෙකී ත්‍රිලක්ෂණ අවබෝධයයි.

# ඇති තතු කියන තිලකුණු දහම

බුදුවරුන් උපන්න ද නූපන්න ද ත්‍රිලක්ෂණය සදාකාලික ව ලොව පවත්නා සත්‍යය යි.
දේශය කුමක් වුව ද, කාලය කුමක් වුව ද, ත්‍රිලක්ෂණය ලොව පවතියි.

එබැවින් එය විශ්ව සාධාරණ ධර්මතාවකි.
දේශ කාල වශයෙන් වෙනස් නොවන සත්‍යයකි.



# ඇති තතු කියන තිලකුණු දහම

## අනිත්‍ය ලක්ෂණය

- අනිත්‍ය යනු වෙනස් වීමයි, කැඩෙන බිඳෙන සුලු බවයි. මෙම කැඩෙන බිඳෙන සුලු බව බුදු දහමේ ලෝක යනුවෙන් හැඳින්වේ.
- ලොව සියල්ල මොහොතින් මොහොත වෙනස් වන බවත් කිසිවක ස්ථීරසාර පැවැත්මක් නොමැති බවත් ය.
- නිදසුනක් ලෙස විදුලි බුබුලක දැල්වීම ගැන සිතන්න. එය අඛණ්ඩ ව දැල්වෙන බවක් පෙනුණ ද සියුම් උපකරණයක ආධාරයෙන් පරීක්ෂා කළහොත් එය නිවෙමින් දැල්වෙමින් පවතින බව දැකිය හැකි ය.



# ඇති නතු කියන තිලකුණු දහම

- විශ්ව ධර්මතාවට සෑම දෙයක් ම යටත් වේ. අපගේ ජීවිතය ද මවු කුස පිළිසිඳ ගත් මොහොතේ සිට ම වෙනස් වේ. මෙම වෙනස සාමාන්‍ය ව්‍යවහාරයේ දී අප සලකන්නේ වයසට යාමක් ලෙස ය.

- බුදු දහමට අනුව හට ගැනීමේ ස්වභාවය ඇති සෑම දේ ම නැති වීමේ ස්වභාවයෙන් යුක්ත වේ. සත්ත්ව, පුද්ගල, ද්‍රව්‍ය ආදී ඕනෑ ම ජීව අජීව පදාර්ථයකට ම මෙම තත්ත්වය සනාතනික වූ පොදු ධර්මතාවකි.

- රූපය පෙණ පිඬක් වැනි ය, වේදනාව දිය බුබුළක් වැනි ය. සඤ්ඤාව මිරිඟුවක් වැනි ය, සංස්කාර කෙසෙල් කඳක් වැනි ය, විඤ්ඤාණය මායාවක් වැනි ය.

# ඇති තතු කියන තිලකුණු දහම

# ඇති තතු කියන තිලකුණු දහම

- බුදු දහම අනුව සත්ත්වයා, ලෝකය යනුවෙන් හැඳින්වෙන්නේ **රූප ධර්ම** හා **නාම ධර්මයන්** ය.

- නාම යනු, **වේදනා** නම් වූ වින්දනය **සංඥා** නම් වූ හැඳිනීම **සංස්කාර** නම් වූ චේතනා සහ **විඤ්ඤාණ** නම් වූ විජානනය හෙවත් අරමුණු දැන ගැනීමයි.

- රූප යනු ඇස,කන, දිව, නාසය, ශරීරය ආදී වශයෙන් බෙදා දැක්විය හැකි අපගේ ශරීරයයි.

- මේ සියල්ල අනිත්‍ය ය. කායික, මානසික, බාහිර, අභ්‍යන්තර, සවිඤ්ඤාණික, අවිඤ්ඤාණික සියල්ල ම මෙම යථාර්ථයට යටත් වන්නේ ය.

# ඇති තතු කියන තිලකුණු දහම

## දුක්ඛ ලක්ෂණය

සැපදායක යැයි සැලකෙන සියලු වින්දනයන් තාවකාලික ය; අනිත්‍ය ය. එබැවින් දුක් සහිත වෙයි. දුක යනු සරල සාමාන්‍ය අප්‍රසන්න වින්දනයක් නොවේ. එය ජීවිතයේ යථාර්ථයයි.



# ඇති තතු කියන තිලකුණු දහම

බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි,

- ඉපදීම දුක ය. මහලු වීම,
- දිරා යාම දුක ය. ලෙඩ වීම
- ව්‍යාධිය දුක ය. මරණය විනාශය දුක ය.
- පයයන්ගෙන් වෙන් වීම දුක ය.
- අපයයන් හා එක් වීම දුක ය.
- කැමැත දේ නොලැබීම දුක ය.



කෙටියෙන් කිව හොත රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන මේ පඤ්ච ස්කන්ධයෙහි තණ්හාවෙන් තදින් එල්බ ගැනීම නොහොත පඤ්ච උපාදානස්කන්ධය ම දුක ය.

## ඇති තතු කියන තිලකුණු දහම


### අනාත්ම ලක්ෂණය

**ආත්ම** යනු සංස්කෘත භාෂාමය යෙදුමකි. එහි පාලි යෙදුම **අත්ත** යන්නයි. සිංහල යෙදුම මම හෙවත් තමා යන්නයි.

නිත්‍ය වූ, ස්ථිර වූ, නොවෙනස් ව පවතින ආත්මයක් හෙවත් මම යැයි ගත හැකි පදාර්ථයක් ඇතැයි බුදුරජාණන් වහන්සේ වැඩ විසූ කාලයේ ඇතැම් මහණ බමුණෝ ඉගැන්වූහ. එසේ ම එබඳු ආත්මයක් ඇති බවට නොයෙක් අයුරින් කරුණු දැක්වූහ; වාද විවාද කළහ.

# ඇති තතු කියන තිලකුණු දහම

ඔවුන්ට අනුව සිතුවිලි සිතන්නේ ද වේදනා විඳින්නේ ද හොඳ නරක කරන්නේ ද විපාක විඳින්නේ ද ආත්මය යි. එය භවයෙන් භවය ගමන් කරයි.



# ඇති තතු කියන තිලකුණු දහම

- මම හෙවත් ආත්මය යනු සිතින් මවා ගත්තක් බව ද විශ්වාස මාත්‍රයක් බව ද බුදු දහම පෙන්වා දෙයි.
- සියලු කෙලෙස් උපදින්නේ ආත්ම දෘෂ්ඨිය නිසා ය.
- යුද ගැටුම්, කලකෝලාහල ඇති වන්නේ ද සියලු අකුසල කරන්නේ ද මගේ ය, මම වෙමි, මගේ ආත්මය වේ, යන වැරැදි දැක්ම නිසා ය.
- මෙසේ ආත්මයක් ඇත යන මතය පසෙකින් තබමින් බුදුරජාණන් වහන්සේ වදාළ සත්‍යය අනාත්ම යන්නයි.

# ඇති තතු කියන තිලකුණු දහම

- ඉහත සඳහන් කළ පරිදි සත්ත්වයා, පුද්ගලයා, මම, ආත්මය යනු සම්මුතියකි. වචන මාත්‍රයකි. ඉන් අදහස් වන්නේ ස්කන්ධ, ධාතු, ආයතන යැයි හැඳින්විය හැකි ශක්ති සමූහයක් පමණි.

- මෙම ශක්ති සියල්ල අනිත්‍ය වන බැවින් දුක් සහිත ය. දුක් සහිත බැවින් අනාත්ම ය. මගේ යැයි, මට යැයි, මගේ ආත්මය යැයි සැලකිය නොහැක්කේ ය.

# ඇති තතු කියන තිලකුණු දහම


- අනිත්‍ය වූ ධර්මයන් නිත්‍ය යැයි ද දුක් සහිත ධර්මයන් සැප යැයි ද අනාත්ම වූ ධර්මයන් ආත්ම යැයි ද අසුභ වූ ධර්මයන් සුබ යැයි ද සංසාරගත සත්ත්වයෝ විකෘතියට පත් ව සිටිති.

- එම විකෘතියෙන් අත්මිදී අනිත්‍ය දේ අනිත්‍ය ලෙසත්, දුක් සහිත දේ දුක් ලෙසත්, අනාත්ම දේ අනාත්ම ලෙසත්, අසුබ දේ අසුබ ලෙසත් ඇති සැටියෙන් දැකීමට බුදු දහම මග පෙන්වයි.

# ඇති තතු කියන තිලකුණු දහම

## තිලකුණු පිළිබඳ අවබෝධයෙන් අපට ඇති ප්‍රයෝජන

1. ලොව ඇති අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්ෂණ එලෙසම අවබෝධ කර ගැනීමට හැකි වේ
2. අසීමිත ආසාවන් ගෙන් තොර වේ
3. අල්පේච්ඡ ගුණයෙන් යුක්ත වේ
4. පහසුවෙන් පෝෂණය කළ හැකිය
5. ඉඳුරන් සන්සුන් ය



# ඇති තතු කියන තිලකුණු දහම

- ලාභයෙන් මත් නොවේ. අලාභයෙන් දුක් නොවේ.
- යසසින් උමතු නොවේ. අයසින් ශෝක නොවේ.
- නින්දා ප්‍රශංසා සැප දුක් ආදියෙන් නොසැලේ. කම්පා නොවේ. එසේ ම තිලකුණු දන්නා දක්නා තැනැත්තා මැදිහත් ය. උත්සාහවන්ත ය.
- ඔහු අන්තගාමී නොවේ.

# ඇති නතු කියන තිලකුණු දහම

අනිච්චාවත සංඛාරා - උප්පාද වයධම්මිනෝ
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තේසං වූපසමෝ සුඛෝ

(පරිනිබ්බාන සූත්‍රය)

ඇති වී නැති ව යන බැවින් සංස්කාර ඒකාන්ත වශයෙන් ම අනිත්‍ය ය. සංස්කාර ඉපදී නැති වන්නේය. ඒ සංස්කාර වල සංසිඳීම සැපයකි.